# නිවේදනය යි!

**1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් (Authorized Officers) සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් (Officers Authorized to Institute Proceedings & Conduct Prosecutions) වෙත:**

**STARPRIME (Acephate 75% SP) සහ MALATHION 25% WP යන නම්වලින් සඳහන් නීතිවිරෝධී නිෂ්පාදන බෙදා හැරීම හා අලෙවි කිරීම.**

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාර රට තුළ භාවිතා වන සියළුම පළිබෝධනාශක නිෂ්පාදන අනුමත ලේබලයකින් සහ ප්‍රමිතියෙන් යුක්තව ලියාපදිංචි වී තිබිය යුතුය. එහෙත්, STARPRIME (Acephate 75% SP) සහ MALATHION 25% WP යන නම්වලින් සඳහන් නීතිවිරෝධී නිෂ්පාදන බෙදා හැරීම හා අලෙවි කිරීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත මූලික තොරතුරු අනාවරණය වී ඇත (ඇමුණුම 1).

මෙම නීතිවිරෝධී නිෂ්පාදන පිළිබඳව පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ සියළුම බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.


ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.


2021 ජූලි මස 13 වන දින,
පේරාදෙණිය.


Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 Mobile 0772363824




ඇමුණුම -1 : STARPRIME (Acephate 75% SP) සහ MALATHION 25% WP යන නම්වලින් සඳහන් නීතිවිරෝධී නිෂ්පාදන